**වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය**

# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

# ඇබෑර්තු

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පවතින පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## තනතුර - කළමනාකරු - ප්‍රසම්පාදන

**සුදුසුකම්** - **බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ව්‍යාපාර පරිපාලනය / ව්‍යාපාර අධ්‍යයනය / ව්‍යාපාර කළමනාකරණය / වැවිලි කළමනාකරණය / කළමනාකරණය / වාණිජ්‍ය / රාජ්‍ය කළමනාකරණය / සැපයුම් දම කළමනාකරණය / සැපයුම් සංවිධාන කළමනාකරණය හෝ තනතුරට අදාළ වෙනත් ඕනෑම උපාධි විෂයක ප්‍රථම උපාධියක්

සහ

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පුද්ගලික අංශයේ ආයතනයක අවම වශයෙන් අවුරුදු එකක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.
2. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙහි, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ, කනිෂ්ඨ කළමනාකරු (JM) ශ්‍රේණියේ තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය** - රු. 91,690/-, 10 x 2, 480/-, 15 x 3, 450/- = 168,240/- (MM1-1-2025) (මාසිකව) + රජයේ අනුමත දීමනා

**මූලික වැටුප් පියවර** - රු. 71,730 (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛනය ii ප්‍රකාරව)

## තනතුර - පරිපාලන නිලධාරී

**සුදුසුකම්** - **බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, මානව සම්පත් / ව්‍යාපාර පාරිපාලනය / ව්‍යාපාර අධ්‍යයනය / ව්‍යාපාර කළමනාකරණය / කළමනාකරණය / වාණිජ්‍ය / රාජ්‍ය කළමනාකරණය හෝ තනතුරට අදාළ වෙනත් ඕනෑම උපාධි විෂයක ප්‍රථම උපාධියක්.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක "කළමනාකාර සහකාර - තාක්ෂණ නොවන" (MA 1-1) ශ්‍රේණිය II තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය** - රු. 72,650/- 10 x 1, 360/-, 18 x 2, 040/- = 122,970/- (IM1-1-2025) (මාසිකව) + රජයේ අනුමත දීමනා

**මූලික වැටුප් පියවර** - රු. 58,615/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛනය ii ප්‍රකාරව)

## තනතුර - සහකාර කළමනාකරු - ප්‍රවාහන

**සුදුසුකම්** - **බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ව්‍යාපාර පරිපාලනය / ව්‍යාපාර අධ්‍යයනය / ව්‍යාපාර කළමනාකරණය / කළමනාකරණය / වාණිජ්‍ය / රාජ්‍ය කළමනාකරණය හෝ තනතුරට අදාළ වෙනත් ඕනෑම උපාධි විෂයක ප්‍රථම උපාධියක්.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක "කළමනාකරණ සහකාර - තාක්ෂණ නොවන" (MA 1-1) ශ්‍රේණිය II තනතුරක අවම වසර පහක (5) සතුටු දායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය** - රු. 72,650/-, 10 x 1, 360/-, 18 x 2, 040/- = 122,970/= (JM - 1- 2025) (මාසිකව) + රජයේ අනුමත දීමනා

**මූලික වැටුප් පියවර** - රු. 58,615/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛනය ii ප්‍රකාරව)

## තනතුර - සහකාර වතු අධිකාරී

**සුදුසුකම්** - **බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 හෝ 3)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කෘෂිකර්මය / වැවිලි කළමනාකරණය හෝ තනතුරට අදාළ වෙනත් ඕනෑම උපාධි විෂයක ප්‍රථම උපාධියක්
2. තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් / ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් නිකුත් කරන ලද තේ කර්මාන්ත ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ Level) 6 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

   **සමග**

   සංස්ථාවක, මණ්ඩලයක, ප්‍රාදේශීය වැවිලි සමාගමක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම.
3. තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් / වැවිලි කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනය විසින් නිකුත් කරන ලද තේ කර්මාන්ත ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

   **සමග**

   සංස්ථාවක, මණ්ඩලයක, ප්‍රාදේශීය වැවිලි සමාගමක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දහයක (10) පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම.

**වැටුප් පරිමාණනය** - රු. 72,650/- 10 x 1,360/-, 18 x 2,040/- = 122,970/- (JM 1-1-2025) (මාසිකව) + රජයේ අනුමත දීමනා

**මූලික වැටුප් පියවර** - රු. 58,615/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛනය ii ප්‍රකාරව)

## තනතුර - සභාපතිගේ පුද්ගලික සහකාර /සාමාන්‍යාධිකාරීගේ පුද්ගලික සහකාර

**සුදුසුකම්** - **බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ව්‍යාපාර පරිපාලනය / ව්‍යාපාර අධ්‍යයනය / ව්‍යාපාර කළමනාකරණය / කළමනාකරණය / වාණිජ්‍ය / රාජ්‍ය කළමනාකරණය හෝ තනතුරට අදාළ වෙනත් ඕනෑම උපාධි විෂයක ප්‍රථම උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයෙහි පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්

**වැටුප් පරිමාණය** - රු. 62,310/-, 10 x 1,360/-, 15 x 1,670/-, 5 x 2,040/- = 111,160/- (MA 5 - 2 - 2025) (මාසිකව) + රජයේ අනුමත දීමනා

**මූලික වැටුප් පියවර** - රු. 51,488/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛනය ii ප්‍රකාරව)

**වයස** - ඉහත තනතුර සඳහා වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව බල නොපැවැත්වේ.

## තනතුර - කළමනාකරණ සහකාර

**සුදුසුකම්** - **බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපනික :**

(අ) පහත සඳහන් විෂයන් ඇතුළුව විෂයන් හතරක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සා/පෙ) විභාගය එකවර විෂයන් හයක් සමත් වී තිබීම.

- i. සිංහල / දෙමළ
- ii. ඉංග්‍රීසි භාෂාව
- iii. ගණිතය

(ආ) අ.පො.ස. (උ/පෙ) විභාගය විෂයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණ හැර) සමත් වී තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ප්‍රාථමික මට්ටමේ පුහුණු සහ ප්‍රාථමික මට්ටමේ නුපුහුණු සේවා කාණ්ඩයේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ඉහත සේවක කාණ්ඩයේ සේවකයින්.

**වැටුප් පරිමාණය** - රු. 46,220/-, 10 x 540/-, 7 x 630/-, 4 x 890/-, 20 x 1,190/- = 83,390/- (MA 1-1-2025) (මාසිකව) + රජයේ අනුමත දීමනා

**මූලික වාටුප් පියවර** - රු. 40,403/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛනය ii ප්‍රකාරව)

**වයස** - වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව බල නොපැවැත්වේ.

**අමතර ප්‍රතිලාභ** - නේවාසික හා බාහිර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ පහසුකම්.

තෝරාගනු ලබන අයදුම්කරුවන් සේවක අර්ථ සාධක අරමුදල හෝ ලංකා වැවිලි කරුවන්ගේ අර්ථසාධක සංගමයට තම වැටුපෙන් 10% ක දායකත්වයක් ලබා දියයුතු අතර, අර්ථසාධක අරමුදල සඳහා වන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ දායකත්වය වැටුපෙන් 12% ක් වන අතර, සේවක භාරකාර අරමුදල සඳහා වන දායකත්වය 3% ක් වේ.

**බඳවා ගැනීමේ පරිපාටිය** - පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන මඩුල්ලක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රථිපල මත බඳවා ගනු ලැබේ.

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය** -

| | | |
|---|---|---|
| ● අදාළ අතිරේක පළපුරුද්ද | - | ලකුණු 30 |
| ● අදාළ අතිරේක සුදුසුකම් | - | ලකුණු 30 |
| ● අනෙකුත් කාර්ය සාධනයන් | - | ලකුණු 15 |
| ● සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කාර්යය සාධනය | - | ලකුණු 25 |
| | | ලකුණු 100 |

**වෙනත්** - මෙම කාණ්ඩ සඳහා වන සියලුම බඳවා ගැනීම්, බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයේ විධිවිධාන වලට අනුකූලව සිදු කරනු ලැබේ.

සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**අයදුම්පත්** - අයදුම්කරුවන් විසින් සියලු විස්තර සහිත ස්වකීය අයදුම්පත් උප්පැන්න සහතිකයේ, අධ්‍යාපන සහතිකවල හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කර පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල හි සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හරහා යොමු කළ යුතුය.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනය** - 2025 ජූලි 04 වන දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනය වෙත ලැබීමට සැලැස්විය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,**
**අංක 257, සිරිධම්ම මාවත, කොළඹ 10.**

**2025.06.19**